දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507, 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

මගේ අංකය )
எனது இல ) DDG/E&OH/EH/01/2021
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 15 / 03 / 2022
Date )

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් / ශ්‍රී ලංකා ජාතික රෝහල / මහනුවර,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම පළාත් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්,
සියලුම සෞඛ්‍ය සේවා ආයතන ප්‍රධානීන්.

<u>අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය අනුව සෞඛ්‍ය ආයතන / රෝහල් වල ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම.</u>

අවිධිමත් අපද්‍රව්‍ය කළමනාකරණය වර්තමානයේ පවතින මූලික පාරිසරික ගැටළුවක් බවට පත් වී ඇති අතර මේ සඳහා සියළු අපද්‍රව්‍ය ආවරණය වන ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය මේ වන විට හඳුන්වා දී ඇත.

ඒ අනුව සියළුම රජයේ රෝහල් වල ජනනය වන අපද්‍රව්‍ය වෙන්කර බැහැරලීමේ ක්‍රමවේදයට අනුගත වීම අත්‍යවශ්‍ය වන අතර, එසේ වෙන් කරනු ලබන උපද්‍රවකාරී නොවන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය , මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි අපද්‍රව්‍ය එකතු කරන්නන් වෙත හෝ මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රලාභී ප්‍රතිචක්‍රීකරණ ආයතන වලට පමණක් ලබා දීමට කටයුතු කළ යුතුය.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය වශයෙන් ගැනෙන විද්‍යුත් හා ඉලෙක්ට්‍රානික අපද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරියේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය එකතු කිරීමට / ගබඩා කිරීමට / ප්‍රවාහනයට හා බැහැර කිරීමට බලපත්‍ර සහිත ආයතන වලට පමණක් ලබා දීමටත් කටයුතු කළ යුතුය.

මෙම අනුමත / බලපත්‍රලාභී ආයතන වල ලැයිස්තුවක් මධ්‍යම පරිසර අධිකාරියේ ( **Web browsing : www.cea.lk - Waste Collectors and Recyclers of Sri Lanka – Registered Collectors of Non-Hazardous Recyclable waste)** වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

උක්ත ක්‍රියාවලිය මගින් රජයේ රෝහල් වල ජනනය වන අපද්‍රව්‍ය විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ බැහැර කිරීමට හැකියාව ලැබෙන අතර මෙම ක්‍රියාවලිය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන මෙන් දන්වා සිටිමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්: ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල් - මධ්‍යම පරිසර අධිකාරිය
නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් - අපද්‍රව්‍ය කළමනාකරණ අංශය- මධ්‍යම පරිසර අධිකාරිය